
අරුම පුදුම
යාළුවා
තරුලී ඔදෙව්නි කපිලරත්න
(සත්‍යය සිදුවීමක් ඇසුරින් )

| | | |
|---|---|---|
| කෘතියේ නම | - | අරුම පුදුම යාළුවා |
| ප්‍රථම මුද්‍රණය | - | **02/08/2025** |
| කතාව සහ චිත්‍ර | - | තරුලි ඔදෙව්නි කපිලරත්න |
| කතෘගේ ලිපිනය | - | අංක **293,** කෝන්ගහමුල<br>පලාපත්වෙල<br>මාතලේ. |
| ශ්‍රේණිය | - | **2** ශ්‍රේණිය **B** |
| **ISBN** අංකය | - | **978-624-208-205-9** |
| පරිගණක අක්ෂර හා<br>පිටු සැකසුම | - | කීර්ති තිරංග<br>කපිලරත්න |



පුරා වසර දෙකක් මා හට දැනුම ලබා දුන්
ආදරණීය තමිලා ගුරු මැණීයන්ට මේ පොත
ආදරයෙන් පුදමි.

# පෙර වදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේදය නිසාය.එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.


ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කර්තෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමු කරන "හෙරණගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය

ශශිකලා සේනාධිර,


මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර




එදා වැසි දිනයක් මම පාසල ඇරී ගෙදර ආවා. ඉක්මනින් ලෑස්ති වී අත්තම්මලාගේ ගෙදරට දිව්වා.




මම දුවගෙන
යනවිට, සේපාලිකා
ගස යට පොඩි
ශබ්දයක් ආවා. මම
ගස ළඟට ගිහින්
බැලුවා. මට
හයියෙන් කෑ
ගැසුනා.




මම හයියෙන් කෑ
ගැසූ ශබ්දය ඇසී
අත්තම්මත්
මල්ලිත්  බය
වෙලා දුවගෙන
ආවා.


චූටි කුරුලු පැටියෙක් බිම වැටිලා හිටියා.



අත්තම්මා පැටියාව වඩාගත්තා. ඌ හොඳටම බයවෙලා. මම කුරුලූ පැටියගේ ඔලුව අත ගෑවා.



අත්තම්මා ඌට වතුර ටිකක් පෙව්වා. ඌ අහිංසක විදියට ඇස් ඇරලා බැලුවා.




ඌ ටික වෙලාවකට පසු පියාඹලා ගියා. අපිට හරිම සතුටුයි.




පසුදින සවස මම සේපාලිකා ගස ළඟින් යනකොට කිචි බිචි ශබ්දයක් ඇසුණා. මම වට පිට බලන විට කුරුලු පැටියා අපිත් එක්ක සෙල්ලම් කරන්න ඇවිල්ලා.



මටයි, අත්තම්මටයි
මල්ලිටයි ගොඩක්
සතුටුයි. ඌ කිචි බිචි
ගගා අත්තෙන්
අත්තට එහාට
මෙහාට පනිනවා.



දැන් හැමදාම
හවසට ඌ අපිට කිචි බිචි
ගාලා ගස ළඟට ඇවිත්
සෙල්ලම් කරන්න
එන්න කියනවා. අපි
ඌට කන්න කෑම
දෙනවා.



දැන් අපිට අලුත් අරුම පුදුම යාළුවෙක් හම්බවුණා.අපිට දැන් ගොඩක් සතුටුයි. අපි දැන් ඌට කියන්නේ චූටි කියලා.




තරුලි කපිලරත්න

2 ශ්‍රේණිය B

මහාමායා බාලිකා විද්‍යාලය,

මහනුවර


# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනය ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැටදහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍යය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යයන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසය එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන් ,දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරිමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාර ,

සෙනවිරත්න මහලේකම්

ISBN 978-624-208-205-9